# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 ජූලි මස 26 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.07.26 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන)

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කිරීමෙන්, ආයතනයේ නාමය වෙනස් කරනු ලැබේ.

***3 වන වගන්තිය :*** මෙය, 2 වන වගන්තිය මඟින් ඉහත පනතට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

# ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 7/2018

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනතින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනයේ සාමාජිකයන් විසින් එහි නාමය සංශෝධනය කිරීම පිණිස යෝජනා සම්මතයක් සම්මත කර ගෙන ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය විසින් එකී යෝජනා සම්මතය බලාත්මක කිරීම සඳහා එහි නාමය සංශෝධනය කිරීමට ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීමට ඉඩදීම සුදුසු වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2018 අංක      දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන පනත හා ලිඛිත නීති යනාදිය සංශෝධනය කිරීම.

2. (1) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 24 දරන ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය පනත එහි "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචන වෙනුවට "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) යම් ලිඛිත නීතියක "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන වෙනුවට "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(3) යම් දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" සම්බන්ධයෙන් ඇති සෑම යෙදුමක් ම "වරලත් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය" සම්බන්ධයෙන් කරන ලද යෙදුමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර කරන ලද ක්‍රියාවල වලංගුභාවය.

3. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම ප්‍රධාන ප්‍රඥප්තියෙන් ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක්, කරන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සියලු කාර්යය සඳහා, වලංගු ලෙස ක්‍රියාත්මක කරන ලද සේ සහ කරන ලද සේ සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.